# පාරිභෝගික ආරක්ෂක ක්‍රම අවශ්‍ය ඇයි

**සාධාරණ ක්‍රමයකට බෙදා හැරීමට හැකි නම් ලෝකයේ දැනට නිෂ්පාදනය කෙරෙන ආහාර ද්‍රව්‍ය ප්‍රමාණය හැම පුද්ගලයෙකු ගේ ම යැපීම් අවශ්‍යතා සපුරා ලීමට තරම් සෑහෙයි. කෙසේ වෙතත්, ඒක පුද්ගල පදනම යටතේ සළකා බැලුව හොත් රට රටවල් අතර ආහාර බෙදා හැරීම සම විධියකට නොකෙරෙන බව පැහැදිලි සත්‍යයෙකි.**

සීඝ්‍රයෙන් වැඩි වෙන ජනගහණයට ආහාර සැපයීම ද, ඔවුන් සාගින්නෙන් හා මන්දපෝෂණයෙනුත් ගලවා ගැනීම ද සඳහා ආණ්ඩුවලට මහත් සටනක් කිරීමට සිදුව ඇත. සියළුම වර්ගයේ ආහාර ද්‍රව්‍ය ඉතා බහුල වශයෙන් සිල්ලර වෙළෙඳ පොළෙහි තිබෙනු දැකීම පාරිභෝගිකයා ගේ කැමැත්ත ය. වෙළෙඳ පොළෙහි ඇති ආහාර ද්‍රව්‍ය රස ගුණ පිරි, සිත් ඇද ගන්නා සුළු, හොඳ තත්වයක පවතින ඒවා වන තරමට ඔහු ද සතුටු ය. එසේ ම මිළ දී ගැනීමට ඇති දෑ පිරිසිදු, ආරක්ෂාදායක, කලවම් හෝ බාල නොකළ, සෞඛ්‍යයට හිතකර අන්දමින් පිළියෙළ කෙරුණු, මනා ලෙස අසුරන ලද ඒවා වන තරමට ඔහු ද තෘප්තිමත් ය. අඩු මිලකට ඉස්තරම් දෙයක් තෝරා ගැනීම සඳහා පාරිභෝගිකයා සතු අයිතිවාසිකම ගැන නිතර නිතර සඳහන් වෙයි.

මීට අමතරව, අලෙවියට අදළ තවත් ඉතාම වැදගත් කරුණු කිහිපයක් තිබේ. ප්‍රමාණයත්, වර්ගය සහ බරත් අනුව අවශ්‍ය කරන තරමට නොඅඩුව ආහාර සැපයීම එක් කරුණකි. අනෙක, ජනගහණයෙන් වැඩි කොටසකට ඔරොත්තු දෙන මිලකට ආහාර ද්‍රව්‍ය ප්‍රමාණවත් තරමින් නිපදවීමට හැකි වන අයුරින් ආහාර මිළ ගණන්වල යුක්ති සහගත මිලක් පවත්වාගෙන යාමය.

ජාතික ආහාර පාලන ක්‍රමයක මූලික ලක්ෂණයක් වනුයේ ප්‍රමාණය, ආරක්ෂාදායී භාවය, පරිපූර්ණ භාවය, වෙළෙඳ පොළ වෙත ඉදිරිපත් කෙරෙන ආකාරය ආදී වැදගත් අවශ්‍යතා සහතික කිරීම ය. ආහාර නීති පද්ධතිය වර්තමානයට ඔබින අයුරින් වෙනස් කොට ක්‍රියාවට ද නැංවීම සඳහා සංවර්ධනය වන හැම රටක් ම පාහේ දැන් උනන්දු වෙන අතර, එම කාර්යයට ආහාර හා කෘෂිකර්ම සංවිධානය, ලෝක සෞඛ්‍යය සංවිධානය වැනි ජාත්‍යන්තර ආයතනවල සහයෝගය ද ලැබී තිබේ. **ජාතික ආහාර ප්‍රතිපත්තියක අවශ්‍යතාවය හැම රටක් ම පාහේ පොදුවේ පිළිගෙන හමාරය. එක් එක් පුද්ගලයා ගේ පෝෂණ අවශ්‍යතාවයන් සඳහා ප්‍රමාණවත් අයුරින් ආහාර සැපයීම සහතික කිරීම මෙවැනි ප්‍රතිපත්තියකින් බලාපොරොත්තු වන මූලික අරමුණු ය.**

**එවැනි ප්‍රතිපත්තියෙක වැදගත් අංග සමහරක් නම්:**

* ජනගහණයෙන් වැඩි කොටසක ගේ ආර්ථික තත්ත්වයට ඔරොත්තු දෙන මිලකට ආහාර ද්‍රව්‍ය නිපදවීමට හැකිවන අයුරින් ධාන්‍ය වැනි අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා සාධාරණ මිළක්,
* ආහාර ද්‍රව්‍ය සාධාරණව බෙදහැරීම සහ ජන සමාජයෙහි ආර්ථික අතින් දුබල කොටස් ආරක්ෂා කිරීමත් සඳහා කාර්යක්ෂම සලාක ක්‍රමයක්;
* ආහාර ද්‍රව්‍යවල තත්ත්වයත්, ආරක්ෂාදයි භාවය මෙන් ම පරිපූර්ණ භාවයත් සහතික කිරීම, වෙළෙඳ මගඩි වැලැක්වීම සහ නිවැරදි වූත්, ප්‍රමාණවත් වූත්, වෙළඳ තොරතුරු පාරිභෝගිකයන්ට සැපැයීම සහ,
* කිරුම්, මිනුම්වල නිරවද්‍යතාවය සහතික කිරීම.

ජාතික ආහාර පාලන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ දී ආහාර සපයා ගැනීම, ආහාර ගබඩා කිරීම, හදිසි අවස්ථාවල දී පාවිච්චි කිරීම

සඳහා ආරක්ෂක තොග පවත්වා ගෙන යාම, ආහාර අපතේ යාම වළක්වා ගැනීම, සමාජයේ දුප්පත් කොටස් වෙනුවෙන් ප්‍රමාණවත් තරමින් ආහාර බෙදා හැරීම, සලාක ක්‍රම ක්‍රියාත්මක කිරීම, තත්ත්ව පාලනය, මිළ පාලනය, ආහාර පාලනය ආදිය ඊට අදාළ කරුණු හැටියට දැක්විය හැකි ය. මේ සැම කරුණක් ම පාහේ අප රටෙහි ද ක්‍රියාත්මක වන බව ඔබ දන්නෙහි ය.

## ආහාර තොග රැස් කිරීම

**ආහාර සැපයුම් ක්‍රමයක් ගොඩ නැංවීම සඳහා රජයකට මුලින් ම අවශ්‍ය වනුයේ අභ්‍යන්තර වශයෙන් හෝ ආනයනය තුළින් සපයා ගනු ලැබූ ආහාර තොගයෙකි. එවැනි තොග සපයා ගැනීමේ දීත්, බෙදා හැරීමේ දීත්, අනුගමනය කෙරෙන උපක්‍රම අතුරෙන් ප්‍රධාන ඒවා පහත දැක්වෙයි.**

නිෂ්පාදකයා සතු අතිරික්ත ආහාර ප්‍රමාණයන් රජය මගින් නියමිත මිලකට ලබා ගෙන කොහෙත්ම නිෂ්පාදනය නොකරන අයත්, අඩුවෙන් නිෂ්පාදනය කරන අයත් ජීවත් කරවීම සඳහා යොදවනු ලැබේ. මෙහි දී ගම් මට්ටමේ පටන් ම ධාන්‍යය තොග රජයේ නියමිත මිල ගණන්වලට රජයෙන් පාලිත ආයතන ඔස්සේ බෙදා හරිනු ලැබේ. මෙවැනි ක්‍රමයක් වඩාත් සාර්ථක වනුයේ ආදායම් සහ විධායක පරිපාලනය මනා ලෙස ක්‍රියාත්මක වුවහොත් පමණි.

නිෂ්පාදකයා සතු අතිරික්ත ආහාර තොගයෙන් සීමා සහිත කොටසක් පමණක් නියමිත මිලකට අනිවාර්යෙන් ම රජයට ලබා ගෙන ඉතිරි කොටස් රජයට හැර වෙනත් පිට කිසිවකුට නොවිකුණන ලෙස තහනම් කිරීම වෙගිලා තවත් උපක්‍රමයෙකි. මෙහි දී ඒකාධිකාරය රජය අත ය. ගමින් පිටත්තර ධාන්‍ය තොග සියල්ල රජය අතට ගැනීමෙන් ඒවායේ මිළ පාලනයක් ඇති කෙරේ. විවෘත වශයෙන් ධාන්‍ය වෙළෙඳමකට ඉඩ නොතැබෙයි. සඟවා තැබීමට ද ඉඩක් නොලැබෙයි. කෙසේ වෙතත් මෙවැනි ක්‍රමයක් සාර්ථක වීම සඳහා කාර්ය මණ්ඩලයෙහි කාර්යක්ෂමතාවය අත්‍යවශ්‍යම ය.

තෙවැනි උපක්‍රමය වනුයේ රජය මගින් නියමිත මිලකට ධාන්‍ය නියමිත ප්‍රමාණයක් පමණක් නිෂ්පාදකයාගෙන් ලබා ගෙන සෙස්ස නිෂ්පාදකයා අතම ඉතිරිකර තැබීම ය.

මෙහි දී නිෂ්පාදකයා අත ඉතිරි වෙන එම කොටස සාමාන්‍ය වෙළෙඳ පොළ වෙත නිරායාශයෙන් ට යැවෙන අතර ඊටම නිසි මිළක් ද නියම වෙයි. කෙසේ වෙතත්, එම ධාන්‍ය ප්‍රමාණයක් එහා මෙහා ගෙන යාමේ යම් යම් සීමා නීති රජයේ අභිමතය පිට පැන වෙන අවස්ථා ද තිබේ. එසේ කෙරෙන්නේ ආහාර සැපයීම් වැඩි දියුණු කළයුතු ප්‍රදේශ ඇති අවස්ථාවල දී ය. මේ අතර, රජය මගින් මිළ දී ගන්නා ලද ධාන්‍ය තොග බෙදා හැරීම සඳහා රජය කැමැති ක්‍රමයක් අනුගමනය කරන අතර, එහි අරමුණ සාමාන්‍යයෙන් ජනතාවට අවශ්‍ය ආහාර සැපයීමත්, පාලන මිලකට බෙදා හැරීමත් වෙළෙඳ පොළෙහි සාමාන්‍ය මිල මට්ටම පහත දැමීමත් ය.

කෙසේ වෙතත්, මේ ක්‍රමයේ දී යම් යම් දුෂ්කරතාවලට මුහුණ දෙන්න සිදුවෙයි. නිදහස් වෙළෙඳ පොළේ මිල මට්ටම ඉතා අධික වන විට ජනයා රජයේ සීමිත තොග වලින් සැපයුම බලාපොරොත්තු වීම මෙහිලා ලොකුම ප්‍රශ්නය යි.

සාමාන්‍ය අලෙවි ක්‍රියා දමයට රජයෙන් කිසිම ඇඟිලි ගැසීමක් නොකෙරෙන, එහෙත්, එක් එක් වෙළෙන්ඳ අතට පත් වෙන ආහාර ප්‍රමාණයන් අතුරෙන් එක්තරා නියමිත කොටසක් නියමිත මිලකට රජය මගින් ලබා ගන්නා ක්‍රමයක් ද සමහර විට අනුගමනය කෙරෙයි. වෙළෙන්ඳ අත ඉතිරි වෙන කොටස ඔහු ගේ මනාපය පරිදි අලෙවි කළ හැකි ය. මෙහි දී මිල සම්බන්ධයෙන් නිරන්තරයෙන් ම නිදහස් වෙළෙඳ පොළක් පවතින අතර, මිල පහත මට්ටමක පවත්වා ගෙන යාම සඳහා කෙරෙන බලපෑමක් හැටියට, රජය මගින් කල් තබා ලබා ගන්නා ලද කොටස නියමිත මිලකට (රජය මගින්) බෙදා හරිනු ලැබේ. මේ ක්‍රමය සාර්ථක වනුයේ ප්‍රමාණවත් තරමින් අතිරික්ත ආහාර තොගයක් තිබුණොත් පමණි.

ඒකාධිකාරී මාර්ගය අනෙක් ක්‍රමය යි. මෙහි දී නිෂ්පාදකයා සතු ධාන්‍ය තොග නියමිත මිලකට ගමතුළම විකුණනවා හැරෙන්නට ගමින් පිටත වෙන කිසිම ගණුදෙනුවකට අවසර දෙනු නොලැබේ. ගමින් පිටතට යැවෙන සියළු ම තොග නියමිත මිලකට රජයට විකිණිය යුතු ය. හිඟ ප්‍රදේශවලට ධාන්‍ය බෙදා හැරීම රජයේ වගකීම වෙයි. මෙහි දී මිල පාලනයක් ඉබේටම මෙන් ක්‍රියාත්මක වනුයේ ගමින් පිටත ආහාර බෙදා

හැරීම රජයේ වගකීම වන නිසා ය. මේ ක්‍රමයෙහි අරමුණ නිෂ්පාදකයාට නපුරක් නොවෙන අයුරින් අතිරික්ත සියළු ම ධාන්‍ය තොග රජය අතට ගැනීම වන අතර, කාර්යක්ෂමව බෙදා හැරීම මත මෙහි සාර්ථක භාවය රඳා පවතී.

මේ ක්‍රමය සාර්ථක කර ගැනීමට නම් ගොවියාට සහතික මිලක් අත්පිට ගෙවීමත්, නිෂ්පාදන මිල දී ගන්නා මධ්‍යස්ථාන ගම් මට්ටමින් පිහිටුවීමත් ඉතා වැදගත් වෙයි. අස්වනු බහුල කාලවල දී නම්, සාධාරණ අවම මිලක් ගොවීන්ට සහතික වීම ද මෙහි සාර්ථක භාවයට තුඩු දෙන තවත් කරුණකි.

**පොදු බෙදා හැරීමේ වැඩ පිළිවෙළක් පවත්වා ගෙනයාමට රජය මගින් අඛණ්ඩව ආරක්ෂක තොග රැස් කර තබා ගත යුතුව ඇත. කෘෂි නිෂ්පාදනවල මිල යහපත් තත්ත්වයක පවත්වා ගෙන යාම සඳහා මෙය රුකුලකි. අස්වනු බහුල කාලවල දී තොග රැස් කොට හිඟ කාලවල දී මුදා හැරීම මෙහි ලක්ෂණයයි. ප්‍රතිඵලය වනුයේ අස්වනු බහුල කාලවල දී මිල නැංවීමටත්, හිඟ කාලවල දී පහත දැමීමටත්, උපකාරී වීම ය.**

## ස්ථාවර මිල මට්ටමක්

තොග රැස් කර තබා ගැනීමේ වැඩ පිළිවෙලක් සංවර්ධනය වන රටවල බොහෝ දුරට යොදා ගනු ලබන්නේ මිල ස්ථාවර මට්ටමක පවත්වා ගෙන යාම පිණිස ය. ඉන්දියාවේ නම්, මිල ගණන් ගොවීන්ට බලාපොරොත්තු නොදෙන අන්දමට පහළ බසින්ට යන වකවානුවල නියමිත ස්ථානයන් හි දී රජය මගින් මිළ දී ගැනීම් ආරම්භ කෙරේ. ලතින් ඇමෙරිකානු සහ අප්‍රිකානු බොහෝ රටවල අලෙවි මණ්ඩල වැනි ආයතන මගින් වරින් වර ගොවි ද්‍රව්‍ය මිල දී ගනු ලැබේ. ශ්‍රී ලංකාව අනුගමනය කරන ක්‍රමය සංවර්ධනය වන වෙනත් රටවල් අනුගමනය කරන ක්‍රමවලට වඩා තරමක් වෙනස් ය. රජයට වී විකිණීමට ගොවීන් නිරායාශයෙන් ම පෙළඹෙන ආකාරයට නිදහස් වෙළෙඳ පොළේ මිළ ගණන් හා තරඟ කළ හැකි අන්දමේ හොඳ සහතික මිලක් වී සඳහා ගෙවනු ලබන අතර, සමූපකාර මගින් වී අලෙවි මණ්ඩලයට නිරන්තරයෙන් ම වී මිල දී ගැනීම ද විශේෂ ලක්ෂණයකි.

**රජය මගින් තොග රැස් කර තබා ගැනීමේ වැඩ පිළිවෙළකින් ප්‍රයෝජන දෙකක් අත් විය හැකි ය. පළමුවැන්න අස්වනු කාල අතරවාරේ දී මිල ගණන් තදින් උච්චාවචලනය වීමට පිළියමක් වශයෙනි. දෙවැන්න අස්වනු කාලයක දී මිල ගණන් සම මට්ටමක තබා ගැනීම සහ අස්වනු පාළුවක දී හිඟයට පිළියමක් ද වශයෙනි.**

තොග රැස් කර තබා ගැනීමේ දී තොගයේ ප්‍රමාණය කොතෙක් විය යුතු ද යන්න තීරණය වෙන්නේ බලාපොරොත්තු වන අස්වනු ප්‍රමාණය, මිල උච්චාවචනයේ ස්වභාවය, ගබඩා ඉඩකඩ ආදිය ගැන සලකා බැලීමෙනි.

**තොග රැස් කිරීමේ දී මුහුණ දීමට සිදු වන ප්‍රධාන ප්‍රශ්නයක් වනුයේ ගබඩාවල දී අපතේ යාම්, නරක්වීම් ආදිය නිසා සිදු වන නාස්තියයි. ධාන්‍ය ආදිය අවුරුදු දෙක තුනක් නරක් නොවී තබා ගත හැකි, විද්‍යානුකූල ආරක්ෂිත ක්‍රම සහිත නවීන ගබඩා පහසුකම් මීට යෙදිය හැකි මූලික පිළියමකි. රැස් කර තබන ආරක්ෂිත තොගයත්, අවශ්‍යතා අනුව පාවිච්චිය සඳහා එදිනෙදා මුදා හරින තොගයත් සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කළහොත් නරක්වීම වළක්වා ගැනීම පිණිස එය හේතු වෙයි.**

ආරක්ෂිත තොගයෙන් වරින් වර මුදා හරිනු ලබන ප්‍රමාණයන් පිළිබඳ මිල ප්‍රතිපත්තිය කෙසේ විය යුතු ද යන්න සහ මුදා හැරිය යුත්තේ කෙබඳු ප්‍රතිපත්තියක් අනුව ද යන්නත් සැලකිය යුතු ප්‍රශ්න දෙකකි. මීට විසඳුම් දෙකක් තිබේ. සාමාන්‍ය ආහාර තොගයෙන් ධාන්‍ය විකුණනු ලබන මිලටම ආරක්ෂිත තොගයේ ධාන්‍ය ද අඩු මිල වෙළෙඳ සැල් මගින් විකිණීම එක් විසඳුමකි. දෙවැන්න පවත්නා මිළ ගණන්වලට ම ආරක්ෂිත තොගයේ ධාන්‍ය විවෘත වෙළෙඳ පොළෙහි තබා විකිණීම ය. මෙහි දී පළමුවැනි ක්‍රමයෙන් රජයට අලාභ සිදු වීමට ඉඩ ඇත. හේතුව, ගබඩා කිරීම වෙනුවෙන් විශාල වියදමක් දැරීමට සිදු වීම ය.

ආරක්ෂිත තොග රැස් කර තබා ගැනීමෙහි ප්‍රධානතම අරමුණ මිල ගණන් සාධාරණ මට්ටමක පවත්වා ගෙන යාම ය. තොග රැස් කිරීමේ ක්‍රියාවලියෙහි දී ආහාර ද්‍රව්‍යවල ප්‍රමාණය අඩුවී මෙන් මෙන් ම තත්ත්වය බාල වීමෙන් ද යම් යම් පාඩු සිදුවීම වැළැක්විය නොහැක. එහෙත් මිල ගණන් ස්ථාවරව රඳ පැවැත්ම ජාතික සංවර්ධනයට විශාල අනුබලයෙකි.

## සලාක ක්‍රමය

වෙළෙඳ පොළෙහි විශාල තොග අවසන් කිරීමට අඩු මිලකුත්, ඉල්ලුම සීමා කිරීමට වැඩි මිලකුත් බලපාන බව පිළිගත් න්‍යාය වෙයි. ධාන්‍ය හිඟයක් ඇති නොවෙන තාක් කල් මෙම න්‍යායට අනුව ධාන්‍ය වෙළෙඳම සතුටුදායක මට්ටමකින් විවෘත වෙළෙඳ පොළෙහි කෙරිගෙන යන නමුත් සැපයුමෙහි කිසියම් අඩුපාඩුවක් ඇති වන විට වෙළෙඳ පොළෙහි ද නොයෙකුත් අක්‍රමිකතා ඇති වීම ස්වභාවයෙකි. සලාක ක්‍රමය වැනි පිළියම් අවශ්‍ය වනුයේ එවැනි අවස්ථාවල දී ය.

පුළුල් වශයෙන් ගෙන බලතොත් බෙදා හැරීම් ප්‍රධාන ක්‍රම තුනෙකි. නිදහස් වෙළෙඳ පොළ, සලාක ක්‍රමය සහ (නිදහස් වෙළෙඳ පොළ ද පසෙක තිබිය දී) සාධාරණ මිලට රජය මගින් බෙදා හැරීම යනුවෙනි. ශ්‍රී ලංකාවේ මේ ක්‍රම තුනම දැනට අනුගමනය කෙරේ.

ආර්ථික අතින් පහත් මට්ටමේ වෙසෙන ජනතාව සඳහා ක්‍රියාත්මක කරන ලද ආහාර මුද්දර ක්‍රමය ද ශ්‍රී ලංකාවේ ආහාර බෙදා හැරීමේ ප්‍රතිපත්තියෙහි කැපීපෙනෙන ලක්ෂණයෙකි. ආහාර මුද්දර ක්‍රමයෙන් සහන සැලසෙන අයගේ සංඛ්‍යාව 70 ලක්ෂයෙකි.

# පහන් වැට

* යමක් කොට පසු තැවෙන්නට නොවෙයි ද, යමක විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් ද යුතුව විඳිය හැකි ද එබඳු දෑ ම කිරීම යහපත් ය. – ධම්මපදය –

* යමකු සමඟ වසරක් කතා බහ කිරීමෙන් ඔහු ගැන වටහා ගැනීමට හැකි දෑට වඩා වැඩි යමක් ඔහු සමඟ පැයක් සෙල්ලම් කිරීමෙන් වටහා ගත හැකි ය.–ප්ලේටෝ–

* මිනිසා ගේ අවශ්‍යතාවයන් සපුරා ලීමට ලෝකයට හැකියාවක් ඇතත්, ඔහු ගේ කෑදරකම් සපුරා ලීමට නම් ඊට හැකියාවක් නොමැත. – මහත්මා ගාන්ධි –

* මල් වලට හිරු එළිය යම් සේද, මනුෂ්‍යත්වයට සිනහව ද එසේ ම ය.
  – ජෝසප් ඇඩිසන් –

* හුඟක් ලබා ගන්න නම් ටිකක් ආසා කරන්න – පිරුළක් –

* දෙව් ලොවත්, අපායත් ගැන යමක් කීමට මම නොකැමැත්තෙමි. මන්ද? ඒ දෙතැන්හිම මගේ මිත්‍රයන් වෙසෙන බැවිනි. – මාර්ක් ට්වේන් –

* සැබැවින් ම දැනුමැති පුද්ගලයාට කැගැසීම පිණිස අවස්ථාවක් නොමැත.
  – ලියොනාඩෝ ඩා වින්සි –

* ජීවිතයේ ද බිය වීමට කිසිවක් නොමැත. ඇත්තේ, අවබෝධ කර ගැනීමට ඇති දෑ පමණි. – මාරි කියුරි –